museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2022 දෙසැම්බර්

**2023–2025 දක්වා CIMAMහි සභාපති ලෙස සුහන්යා රෆෙල් පත්කර ඇත.**

2023–2025 වර්ෂ සඳහා නූතන කලා කෞතුකාගාර සහ එකතු පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ (CIMAM) සභාපති ලෙස M+හි අධ්‍යක්ෂක සුහන්යා රෆෙල් පත්කර ඇත. රෆෙල්, හොංකොංහි දෘශ්‍ය කලා කෞතුකාගාරයක්වන M+හි ප්‍රධානියා ලෙස 2019 සිට කටයුතුකර ඇත. ඇය ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ (MMCA ශ්‍රී ලංකා) ආරම්භක කමිටු සාමාජිකයෙක් ද වේ.

ඇගේ පත්වීම පිළිගනිමින් රෆෙල් සඳහන්කළේ, "CIMAMහි මීළඟ සභාපති ලෙස කටයුතුකිරීම ගෞරවයක්වන අතර, සංකීර්ණ හා අභියෝගාත්මක ලෝකයක් හමුවේ අපගේ නූතන හා සමකාලීන කලා කෞතුකාගාර ප්‍රජාවට දායකවීම සඳහා මගේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමඟ එක්ව කටයුතු කිරීමට මම උද්යෝගයෙන් ඉන්නවා” යනුවෙනි.

ඇය තවදුරටත් කියා සිටියේ, “පසුගිය වසර තුන තුළ බොහෝ කැලඹීම් සහ බෙදීම් සිදුවුණු අතර, Covid-19 ගෝලීය වසංගතය අපගේ සමාජ තුළ තවත් දුරස්භාවයක් එක්කළා. මෙම සන්දර්භය තුළ, කලාකරුවන්ගේ කෘති අවශ්‍ය තීක්ෂණ බුද්ධිය, දැක්ම, හා දෘෂ්ටිකෝණය සපයද්දී මිනිසුන් එක්කිරීමෙහිලා අප කෞතුකාගාර ඉටුකරන භූමිකා වෙන කවරදාකටත් වඩා වැදගත්” යනුවෙනි.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org